## සමපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර අතිරික්ත අරමුදල

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මාගේ පරීක්ෂණයන්ගෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර අතිරික්ත අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර අතිරික්ත අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

##### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4:3 ඡේදය ප්‍රකාරව 2010 මූල්‍ය ප්‍රකාශන 2011 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුණේ 2012 ජූලි 17 දින එනම් නියමිත දිනට මාස 16 කට පමණ පසුවය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අරමුදලට අදාල 2010 වර්ෂයේ ගනුදෙනු විගණනයට භාජනය කර නිරීක්ෂණය වූ කරුණු 2012 ජනවාරි 31 දිනැති මාගේ වාර්තාව මඟින් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත්කරන ලදී. ඊට වැඩිමනත් වශයෙන් ගිණුම් සම්බන්ධයෙන් වන මාගේ නිරීක්ෂණයන්ද මෙම වාර්තාවට ඇතුලත් කර ඇත.

##### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ක්ෂය ප්‍රතිපත්තිය හැර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශුද්ධ අගය රු. 1 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු දැනට භාවිතයේ පවතින එක් මෝටර් වාහනයක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 අගෝස්තු 31 දින බැංකුවක ආයෝජනය කරන ලද රු.3,700,000 ක්වූ ස්ථාවර තැන්පතුවකට අදාල පොලිය 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට සමුපකාර අතිරික්ත අරමුදලින් සමුපකාර සමිති වලට ලබා දුන් ණය මුදල් වලින් අයවිය යුතු මුදල රු.236,117,752 ක් වූ අතර, ඉන් රු.161,675,259 ක් එනම් 68% ක් එදිනට අක්‍රිය ණය ලෙස පැවැතියද, ඒ සඳහා අවශ්‍ය බොල් ණය ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි.

### 1.2.4 නොසැසඳුනු පාලන ගිණුම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පාලන ගිණුම් වල දැක්වුණු ශේෂයන් සමඟ ඒවායේ උපලේඛන වල ශේෂයන් නොසැසඳුනු අවස්ථා නිරීක්ෂණය විය.

| අයිතමය | පාලන ගිණුම අනුව ශේෂය | උපලේඛනය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සමුපකාර සමිති ණය | 111,337,242 | 236,117,752 | 124,780,510 |
| සමුපකාර සමිති ණය පොළි | 50,813,572 | 538,185 | 50,275,387 |
| යතුරු පැදි ණය වාරික අයවීම් | 279,365 | 287,701 | 8,336 |
| ස්ථාවර වත්කම් ශුද්ධ අගය | 2,186,384 | 1,728,195 | 458,189 |

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වත්කම් ගිණුම් 02 කට අදාල එකතුව රු.6,541,119 ක් හා බැරකම් ගිණුම් 05 කට අදාල එකතුව රු.16,894,068 ක් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර, එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ගිණුම් සකස් කිරීමේදී හඳුනාගෙන තිබූ එකතුව රු.558,419 ක්වූ නිරවුල් නොකරන ලද ශේෂයන් 04 ක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට /සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| ගිණුම් විස්තරය | වටිනාකම | විගණනයට ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) දේපල, පිරියත, උපකරණ | 2,186,384 | ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ආ) සමුපකාර සමිති ණය | 236,117,752 | එකතුව රු.231,048,610 ශේෂ සඳහා තහවුරුකිරීම් හා එකතුව රු.111,337,242 ක් සඳහා කාල විශ්ලේෂණය |
| (ඇ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ණය | 90,749,041 | ශේෂ තහවුරු කිරීම් |
| (ඈ) ව්‍යාපෘති ණය | 5,000,000 | |
| (ඉ) වියදම් | 1,500,000 | වියදම් විස්තර හා ආදායකයා මුදල් ලබාගත් බවට කුවිතාන්සි |
| (ඊ) ජාතික සමුපකාර මණ්ඩලයට ලබාදුන් ආධාර | 2,000,000 | වියදම් විස්තර |

## 1.2.7 නීති ,රීති, රෙගුලාස හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති ,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2004 ජුලි 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 25 | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අතිරික්ත මුදල් බැංකු ගිණුම්වල ආයෝජනය කිරීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද,සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කර තිබූ එකතුව රු.118,000,000 ක්වූ ආයෝජන සම්බන්ධයෙන් එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අරමුදලේ වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| | - 04 .1 ජේදය (අ) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය නියමිත පරිදි ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| | - 04.3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාර්ය සාධන වාර්තාවක් හා සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි

----------------------------

| | |
|---|---|
| (i) මු.රෙ. 189 හා 486 | මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ කීහිපයක සිට ඉදිරියට ගෙන එන රු.1,511,632 ක්වූ අගරු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 264 | රු.16,179,271 ක වටිනාකමැති වවුචර් සම්බන්ධයෙන් ආදායකයා විසින් මුදල් ලබා ගත් බවට සහතික කෙරෙන කුවිතාන්සි ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.89,717,858 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.105,834,441 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,116,583 ක පිරිහීමක් නිරීක්ෂණය විය. 2009 වර්ෂයේ රු.52,222,689 ක් වූ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.47,324,940 කින් හෙවත් 91% කින් අඩු වී තිබීම හා 2009 වර්ෂයේ රු.2,481,358 ක් වූ වෙනත් වියදම් සමාලෝචිත වර්ෂයේදී රු.3,918,642 කින් හෙවත් 61% කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 ආර්ථික නොවූ ගනුදෙනු

2008 වර්ෂයේ සමුපකාර අතිරික්ත අරමුදලින් ව්‍යාපෘති ණය ලෙස සමිති දෙකක් සඳහා පොලී අයකිරීමකින් තොරව රු.19,849,750 ක් ලබාදී තිබුණි. ඉන් එක් සමිතියකට ලබාදුන් රු.5,000,000 ක වූ මුදල 2012 ඔක්තෝබර් 10 දින දක්වාම අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) ණය අයකර ගැනීම.

මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයෙන් ලැබිය යුතු ණය.

2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයෙන් අයවිය යුතු ණය පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| කාල සීමාව (වර්ෂ) | ලබා දුන් ණය මුදල රු. | 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු. |
|---|---|---|
| 10 ට වැඩි | 27,500,000 | 11,942,219 |
| 05 - 10 අතර | 10,000,000 | 9,166,667 |
| 01 - 05 අතර | 26,419,038 | 17,919,038 |
| 01 ට අඩු | 3,000,000 | 3,000,000 |
| | 66,919,038 | 42,027,924 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

I. 2010 දෙසැම්බර් 31 දිනට සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයට රු. 66,919,038 ක ණය මුදල් ප්‍රමාණයක් ලබා දී තිබූ අතර, මෙම ණය වලින් රු. 42,027,924 ක මුදලක් එනම් 63% ක් අයවිය යුතුව පැවැතුණි.

II. 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය මුදලින් රු.39,027,924 හෙවත් 93 % ක අක්‍රිය ණය ලෙස පැවතුණි.

(ii) භාණ්ඩාගාර පරිපාලන ණය

භාණ්ඩාගාර පරිපාලන ණය වශයෙන් ලබාදී තිබූ රු.450,000,000 ක ණය මුදලින් 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය ශේෂය රු.90,749,041 ක්ද ඊට අදාල වූ හිඟ පොලිය රු.30,964,789 ක්ද විය. මෙම ණය මුදල හා පොලිය අයකරගත යුතු බවට පසුගිය විගණන වාර්තාවෙන්ද පෙන්වා දුන් නමුත් මෙම වාර්තාවේ දිනය දක්වාම එම ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලබා දී ඇති ණය වෙනුවෙන් දෙපාර්තමේන්තුව ඇප වීම.

පහත කරුණු නිරීක්ෂණය විය.

i. සමුපකාර සංගම් දෙකකට 2004 වර්ෂයේදී රාජ්‍ය බැංකුවකින් රු. මිලියන 80 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා සමුපකාර අතිරික්ත අරමුදලට අයත් රු. මිලියන 80 ක් වූ ස්ථාවර තැන්පතු, ඇප තැන්පතු ලෙස තබා තිබුණි. එයින් එක් සමුපකාර සංගමයක් විසින් ලබා ගෙන තිබූ ණය මුදල නොගෙවීම මත අතිරික්ත අරමුදලේ ස්ථාවර තැන්පතු වලින්, රු. මිලියන 16.4 ක් වූ මුදලක් ඊට හිලව් කර ගෙන තිබුණි. එසේ හිලව් කර ගත් මුදල අදාල සංගමයෙන් 2012 දෙසැම්බර් 18 දින දක්වාම අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

ii. ඉහත ණය මුදලට අමතරව එක් සමුපකාර සංගමයකට 2008 වර්ෂයේදී රාජ්‍ය බැංකුවකින් ණයවර ලිපියක් ලබා ගැනීම වෙනුවෙන් සමුපකාර අතිරික්ත අරමුදලේ රු. මිලියන 50 ක වටිනාකමින් යුත් ස්ථාවර තැන්පතු දෙකක් ඇප සුරැකුම් ලෙස ලබා දී තිබූ අතර 2012 දෙසැම්බර් වන විට වසර හතරකට වැඩි කාලයක් ගත වී තිබුණ ද රු.මිලියන 35.8 ක වූ මුදලක් නිදහස් කර ගැනීමට 2012 දෙසැම්බර් 18 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තර සමූපකාර දින සැමරුම් උළෙල - 2010

"සමූපකාර ව්‍යවසාය මගින් කාන්තාවන් සවිබල ගැන්වීම" යන තේමාව යටතේ ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් සංවිධානය කර තිබුණු 2010 ජාත්‍යන්තර සමූපකාර දින සැමරුම් උළෙල සඳහා සමුපකාර අතිරික්ත අරමුදලින් රුපියල් මිලියන 1.5 ක් ලබා දී තිබූ අතර, අදාල උළෙලට සමගාමීව යුද්ධයෙන් හානි වූ ප්‍රදේශවල සමූපකාර සමිති වෙනුවෙන් ප්‍රතිසංවර්ධන වැඩසටහනක්ද ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. සමාරම්භක උළෙලේ කටයුතු උක්ත තේමාවෙන් පරබාහිරව සිදු කර තිබූ අතර, සමූපකාර අතිරික්ත අරමුදලින් ලබා දී තිබූ මුදල වැය කිරීම් සම්බන්ධව පසු විපරම් කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම සිදු කර නොතිබුණි.

ii. ඉහත ප්‍රතිසංවර්ධන වැඩසටහන යටතේ රු.250,000 ක වැය ඇසතමේන්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ කරච්චි නැගෙනහිර විවිධ සේවා සමූපකාර සමිති ශාඛාව ප්‍රතිසංස්කරණය කිරීමට 2012 දෙසැම්බර් 18 දින දක්වාම පියවර ගෙන නොතිබුණි.

## 2.2.3 අරමුණු වලට පටහැනි ගෙවීම්

අතිරික්ත අරමුදලේ බැරට තිබෙන මුදල් 1974 ජනවාරි 10 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 93/5 දරණ ගැසට් පත්‍රයේ 44 ( iii ) වගන්තියේ සඳහන් කාර්යයන් වන ප්‍රාථමික සමිතිවල කොටස් හා ස්ථාවර වත්කම් මිලදී ගැනීමට, ඇවරකරුවෙකුට විරුද්ධ නඩුවල දී ඔහුගේ නිදහසට ක්‍රියාකිරීම සඳහා ආධාර කිරීමට හා ලියාපදිංචි සමිති සඳහා ආධාර කිරීමට යෙදිය යුතු වුවද, ඊට පරබාහිර 2006 වර්ෂයේ පැවති සමුපකාර සියවස් සමරු උළෙලේ වියදම් පියවා ගැනීම, පුහුණු වැඩමුළු, අධ්‍යාපනික සම්මන්ත්‍රණ, සාංවත්සරික උත්සව හා දෙපාර්තමේන්තුවට අවශ්‍ය වත්කම් මිලදී ගැනීම යනාදී කාර්යයන් සඳහා රු. 2,941,990 ක වැය කර තිබුණි.

## 2.2.4 අභ්‍යන්තර විගණනය

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන වැඩසටහනක් පිළියෙළ කර තිබුණද, ඒ අනුව සිදු කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා 2012 දෙසැම්බර් 18 දින දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2.5 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හා තථ්‍ය අගයන් අතර, පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.109,850,000 ක් වූ ඇස්තමේන්තුගත මුළු ආදායමට සාපේක්ෂව තථ්‍ය මුළු ආදායම් රු.96,407,751 ක් එනම් 87.77% ක් විය.

(ආ) එකතුව රු.70,000,000 ක් වූ ඇස්තමේන්තුගත මුළු වියදමට සාපේක්ෂව තථ්‍ය මුළු වියදම් රු.102,504,483 ක් එනම් 146.43% ක් විය.

එහෙයින් කළමණාකරනය විසින් අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමසාරිස්වරයාගේ අවධානයට වරින් වර යොම කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ණය
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) ස්ථාවර වත්කම්